**නොච්චියාගම ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**-----------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2018 මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 01 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 09 දිනද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජුලි 09 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති
-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළයුතුය. | පිළිගනිමී. |

(ආ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඉහලවැටියාව ජල ව්‍යාපෘතියේ බිල්කල ආදායම රු.4,195,768 ක් වුවද ආදායම් වියදම් ගිණුමේ රු.4,223,262 ක් ලෙස දක්වා තිබුණු බැවින් රු.27,494 ක් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි වටිනාකම් ගිණුම් මගින් හෙළිදරව් කළයුතු වේ. | නිවැරදි බිල්කල වටිනාකම යොදා මෙම වරද නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව දැනුම් දෙමි. |
| (ii) | දේශීය ණය සහ සංවර්ධන අරමුදල් ණය ශේෂය සඳහා සමාලෝචිත වර්ෂයේ ණය පොළිය රු.878,359 ක් වියදම් ලෙස දක්වා නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ පොලිය වියදම් ලෙස ආදායම් වියදම් ගිණුමේ දැක්විය යුතු වේ. | මෙම වරද නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ විශ්‍රාම වැටුප් හා පාරිතෝෂිත වියදම් වටිනාකම හදුනාගෙන පුනරාවර්තන වියදම් ලෙස ආදායම් වියදම් ගිණුමේ දක්වා නොතිබුණි. | සමාලෝචිත වර්ෂයට අදාල සියළු වියදම් ගිණුම්ගත කළ යුතු වේ. | සමාලෝචිත වර්ෂයේදී විශ්‍රාම වැටුප් හා පාරිතෝෂිත වියදම් පුනරාවර්තන වියදම් ලෙස ආදායම් වියදම් ගිණුමේ දක්වා නොමැති බව දැනුම් දෙමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ප්‍රතිපාදන වෙන්කිරීම කළයුතු වේ. | නිශ්චිත වටිනාකමක් හදුනාගත නොහැකි බැවින් ප්‍රතිපාදන වෙන් කර නොමැති බව දැනුම් දෙමි. |
| (v) | දේශීය ණය සහ සංවර්ධන අරමුදල් යටතේ 2018 වර්ෂයේ අවසාන කාර්තුව සඳහා ගෙවා නොතිබූ ණය වාරිකය හා පොළිය රු.1,154,011 ජංගම වගකීම් ලෙස ශේෂ පත්‍රයේ දක්වා නොතිබුණි. | ගෙවිය යුතු වටිනාකම ණයහිමියන් ලෙස දැක්විය යුතු වේ. | ණයහිමියන් යටතේ මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේදී පෙන්වා නොමැති බව පිලිගනිමි. මෙම වරද නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| (vi) | 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වර්ෂවලට අදාලව ලැබිය යුතු රු.3,999,265 ක් මුද්දර ගාස්තු මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | නිවැරදි තොරතුරු ගිණුම් මගින් හෙළිදරව් කළයුතු වේ. | මෙම උපලේඛණ නැවත පරීක්ෂා කර බලා තහවුරු කර එම ආදායම් ලබා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (vii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබුණු විදුලි ගාස්තු රු.37,669 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | සමාලෝචිත වර්ෂයට අදාල සියළු වියදම් නිවැරදිව ගිණුම්ගත කිරිමට පියවර ගත යුතු වේ. | මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

(ඇ) නොසැසඳුණු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2018 දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 5 කට අදාලව අවසන් ගිණුමේ දක්වා තිබූ ශේෂය හා අදාල ලේඛන අනුව ශේෂය අතර රු.3,447,720 ක වෙනසක එකතුවක් විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළයුතුය. | පිළිගනිමි. මෙම වෙනස නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| (ii) | 2018 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රයේ ස්ථාවර වත්කම් වටිනාකම රු.226,430,376 ක් වුවද එයට සමාන්තරව පැවතිය යුතු ප්‍රාග්ධන යෙදවුමෙන් ආදායමට දායකවීමේ ගිණුමේ වටිනාකම රු.226,112,126 වුයෙන් අදාල ගිණුම් අතර රු.318,250 ක් වෙනසක් විය. | ස්ථාවර වත්කම් ශේෂය ප්‍රාග්ධන යෙදවුමෙන් ආදායමට දායකවීමේ ගිණුමට සමානව පවත්වාගෙන යායුතු වේ. | 2018 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් වටිනාකම රු.226,430,376ක් වේ. කල්බදු පදනමින් ලබාගත් AAU – 1256 ත්‍රිරෝද රථයෙහි කල්බදු වාරිකය මෙම වෙනසට හේතුව විය. |

(ඉ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වසර 05 කට පෙර සිට පැවත එන රු.7,904,497 ක් වු ලැබිය යුතු ගිණුම් ශේෂ 02 ක් අයකර ගෙන නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | සභාව සතු වෙළඳසැල් සහ කඩ කුලියට දීම් හා සභාව සතු පූර්වටු නිවාස 05 ක් කුලියට ලබා දීමෙන් ඇති වූ හිග ශේෂයකි. මේ සම්බන්ධව නීති ක්‍රියාමාර්ග ගනිමින් සිටින බව කාරුණිකව දැනුම් දෙමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 05ක සිට වසර 21 ක් දක්වා කාලපරිච්ඡේදයක සිට අය නොවෙමින් පවතින රජයේ දේපල 10කින් ලැබිය යුතුව තිබුණු රු.592,375 ක වරිපනම් බදු අයකරගෙන නොතිබුණි | අදාල ආයතන මගින් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | රජයේ ආයතන වල පවතින වරිපනම් හිග සම්බන්ධව ලිඛිතව මේ වන විට දැනුවත් කිරීමට කටයුතු කරමින් පවතින අතර ඉදිරියේදී වරිපනම් නොගෙවන රජයේ ආයතන සඳහා නීතිමය පියවර ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (iii) | වර්ෂ 05 ක් ඉක්මවූ කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල පැවත එමින් තිබුණු එකතුව රු.3,622,818 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 04 ක් සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. | මෙම විශ්‍රාම වැටුප් හා ප්‍රතිලාභ හා පාරිතෝෂිත ගෙවිය යුතු නිලධාරීන් කවුරුන්ද යන්න නිශ්චිතව හදුනාගත නොහැකි බැවින් එම දායක මුදල් ගෙවීමක් සිදු නොකරයි. මුද්දර බද්ද හා ජාතිය ගොඩනැගීමේ බද්ද හා රැඳවුම් බද්ද ආදි ගෙවිය යුතු ශේෂ 2019 වර්ෂයේදී එම ආයතන සමඟ සාකච්ඡා කර තහවුරු කර ගනිමින් ඉදිරියේදී ගෙවීම් කිරීමට කටයුතු කරන බව දැනුම් දෙමි. |

(ඊ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු. රු.14,470,756 ක්වූ ගිණුම් විෂයයන් 08 කට අදාලව විස්තරාත්මක උපලේඛන, වයස් විශ්ලේෂණ, සනාථ කිරීමේ ලිපි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වටිනාකම් සනාථ කිරීමට අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. | ඉදිරියේදි ඉදිරිපත් කරමි. |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමණාකරන තිරණ වලට අනුකූල නොවීම.

| | නීති,රීති,රෙගුලාසි හා කළමණාකරන තීරණ වලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1951 අංක 14 දරන මෝටර් වාහන පනත 203 අධිකාරිය | සභාව සතු වාහන 05 ක් ලියාපදිංචි නොකර ධාවනයේ යොදවා තිබුණි. | පනතට අනුව කටයුතු කළයුතු වේ. | ලිපි ලේඛන වල ඇති තොරතුරු පරස්පර වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>-------------------------- | | | |
| (i) මු. රෙ. 189 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ ගිණුම් 2 තැන්පත්කර තිබුණු මාස 06 සිට වසර 04 දක්වා කාලපරිච්ඡේදයක සිට උපලබ්ධි නොවූ චෙක්පත් 16 ක් සම්බන්ධව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළයුතු වේ. | සභාවේ ගිණුම් 02 හි උපලබ්ධි නොවූ චෙක්පත් ප්‍රමාණය 16ක් බව කාරුණිකව සදහන් කරමි |
| (ii) මු. රෙ. 454(2) | ප්‍රාදේශීය සභාවේ සියළුම ගොඩනැගිලි විදුලි උපාංග පිළිබද ලේඛනය පවත්වාගෙන ගොස් නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළයුතු වේ. | ප්‍රාදේශීය සභාවේ සියළුම ගොඩනැගිලි විදුලි උපාංග පිළිබඳ ලේඛනයක් පිළියෙල කර නොමැත. ඉදිරියේදී මෙම ලේඛනය පිළියෙල කර පවත්වාගෙන යෑමට කටයුතු කරමි. |
| (ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br>-------------------------- | | | |
| i. 2009 අප්‍රේල් 16 දිනැති 09/2009 දරන චක්‍රලේඛය | ඇඟිලි සලකුණු යන්ත්‍ර ස්ථාපිත කිරිම හා අතිකාල හා නිවාඩු දින සේවා කිරීමේදි එම චක්‍රලේඛය ප්‍රකාරව සේවාකාලය තීරණය කිරිම සිදු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | 2009 අප්‍රේල් 16 දිනැති 09/2009 දරණ චක්‍රලේඛ ප්‍රකාරව ඇඟිලි සළකුණු යන්ත්‍ර ස්ථාපිත කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව කාරුණිකව දැනුම් දෙමි. |
| ii. 2016 දෙසැම්බර් 29 දිනැති 30/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන 19 ක් සම්බන්ධව ඉන්ධන දහනය පිළිබද පරික්ෂාවක් සිදුකර නොතිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළයුතු වේ. | සභාව සතු වාහන වල 2018 වර්ෂයේ ඉන්ධන පරීක්ෂාව සිදු කර නොමැත. |
| (ඇ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක ,උපාංග හා මෘදුකාංග පිළිබද ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | චක්‍රලේඛය අනුව අදාල උපාංග හා මෘදුකාංග ලේඛනය පවත්වාගෙන යායුතු වේ. | පරිඝණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛණය 2019 වර්ෂයේ පිළියෙල කොට පවත්වාගෙන යෑමට කටයුතු කරන බව දැනුම්දෙමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,229,079 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,772,812 ක් විය .

### 2 .2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම් ,බිල් කල ආදායම්,රැස්කල ආදායම් හා හිග ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්,බිල්කල ආදායම් ,රැස්කල ආදායම් හා හිග ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කල ආදායම | රැස්කල ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිගය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 2,568,970 | 2,477,805 | 1,824,083 | 5,247,493 | 2,518,970 | 2,351,375 | 1,446,521 | 4,593,771 |
| (ii) | කුලී | 6,455,300 | 3,863,580 | 3,518,130 | 7,736,557 | 5,752,300 | 7,270,823 | 6,619,523 | 7,391,107 |
| (iii) | බලපත්‍ර ගාස්තු හා සේවා | 16,995,700 | 6,299,480 | 6,248,120 | 5,828,761 | 20,623,900 | 7,195,655 | 5,373,326 | 5,777,401 |
| (iv) | වෙනත් ආදායම් | 18,251,000 | 12,030,488 | 12,950,813 | 2,592,204 | 12,296,600 | 12,050,386 | 10,769,095 | 3,512,529 |
| | | 44,270,970 | 24,671,353 | 24,541,146 | 21,405,015 | 41,191,770 | 28,868,239 | 24,208,465 | 21,274,808 |

#### 2.2.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත කාලපරිච්ඡේදය තුල බිල්කල වරිපනම් බදු ප්‍රමාණය රු.1,765,005 ක් වුවද රැස්කර තිබුණේ සියයට 37 ක ප්‍රමාණයක් වන රු.647,474 පමණ විය ඉතිරි හිග වරිපනම් රු. 5,247,493 ක් අයකර නොතිබුණි. | හිඟ වරිපනම් අය කළයුතු වේ. | නොච්චියාගම ප්‍රාදේශීය සභාව සතු කඩ කාමර වරිපනම් තක්සේරුවේ දී තක්සේරු කර ඇති අතර මෙම කඩ කාමර වලින් වරිපනම් අය කර ගැනීමකින් තොරව වාර්ෂිකව බිල් කර ඉදිරියට ඒ තුලින් වරිපනම් හිගයක් ලෙස ලේඛණ වල පෙන්වයි. |
| (ආ) | වරිපනම් බදු සම්බන්ධව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව දියුණු කල ප්‍රදේශ ප්‍රකාශයට පත් කළයුතු වේ. | පනතට අනුව කටයුතු කළයුතු වේ. | වරිපනම් බදු පැනවීමට දියුණු කළ ප්‍රදේශ ගැසට් කළ ලියවිලි කිසිවක් සොයා ගැනීමට නොමැති අතර ඒ ලියකියවිලි ඉදිරියේදී සෙවීමට කටයුතු කරමී. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 1988 මැයි 17 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ අංක 1988/22 ප්‍රකාරව බදු අයකරන ප්‍රදේශවල දේපල වසර 5 කට වරක්වත් තක්සේරු කර නොතිබුණි. | අදාල චක්‍රලේඛය අනුව කටයුතු කළයුතු වේ. | මෙම වර්ෂයේදී වරිපනම් ප්‍රතිශෝධනයක් කිරීම සඳහා කටයුතු කරමි. |
| (ඇ) | 1987 ප්‍රාදේශීය සභා පනතේ 135 වගන්තිය ප්‍රකාරව වරිපනම් සම්බන්ධව පොදු ආගමික , පුන්‍යකර්ම, අධ්‍යාපනික හා ගෘහ නිදහස් කිරීම ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. | නිදහස් කර ඇති දේපල සම්බන්ධ ලේඛන පිළියෙල කළයුතුය. | නිදහස් කර ඇති දේපළ පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කිරීමට ඉදිරියේදී කටයුතු කරමි. |

2.2.3 කුළී
------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------------- | -------------------------------- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ බිල්කල කඩකුලි හා ගෙවල්කුලි ආදායමින් රු.5,993,725 ක් අයකර නොතිබුණි. | හිඟ ආදායම අයකළ යුතු වේ. | නීතිමය පියවර ගෙන හිඟ අය කර ගැනීමට කටයුතු කරමි. |

2.2.4 වෙනත් ආදායම්
-----------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | -------------------- | ------------------------------------ |
| (අ) | 2013 වර්ෂයේ සිට 2018 වර්ෂයට අදාලව ලැබිය යුතු මුද්දර ගාස්තු ප්‍රමාණය ප්‍රධාන ලේකම් වෙතින් විමසා නිරවුල් කරගැනීමට කටයුතු කර නොතිබුණි. | ලේඛන නඩත්තු කිරීම හා ආදායම් රැස් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු යුතුය. | ලැබිය යුතු මුද්දර බදු වටිනාකම් වලට අදාළ උප ලේඛන 2019 මැයි 16 වන දින ඉඩම් රෙජිස්ටාර් කාර්යාලයෙන් අප වෙත ලැබී ඇත. |
| (ආ) | ඉහල වැටියාව ,කුකුල් කටුව, හොරුවිල, නොච්චියාගම යන ප්‍රදේශවල පවත්වාගෙන යනු ලබන ජල ව්‍යාපෘති සම්බන්ධව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව පැවති හිඟ මුදල රු.5,234,721 ක් විය. | හිඟ මුදල් අයකර ගැනිමට කටයුතු කළයුතු වේ. | මෙම ජල ව්‍යාපෘති වලට අදාළ හිඟ මුදල් වලින් වැඩි ප්‍රමාණයක් ප්‍රවර්ථන වර්ෂයේ මාර්තු මස වන විට රැස්කර ගෙන ඇති අතර ඉතිරි ප්‍රමාණයන්ද අය කර ගැනීමට අවශ්‍ය සුදුසු කටයුතු සිදු කරමින් පවතින බව දැනුම් දෙමි. |

03. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

3.1 කාර්ය සාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝජිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරිම,ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරිම පිළිබදව නිරීක්ෂණය වු කරුණු පහත දැක්වේ.

(අ). අතුරු ව්‍යවස්ථා

----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | පනත අනුව කටයුතු කළයුතු වේ. | මෙම වගන්තිය ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා කිහිපයක් වැළඳගෙන ඇති අතර අනෙක් කරුණු සම්බන්ධයෙන්ද නව අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දැනුම් දෙමි. |

(ආ). ක්‍රියාකාරි සැලැස්ම

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්මක් සකස් කළ යුතු වේ. | 2019 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කොට ඒ අනුව වර්ෂයේ නියමිත කර්තව්‍යයන් සිදු කරගෙන යනු ලබයි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ප්‍රකාරව ලගාකරගත යුතු අරමුණු පිළිබදව දැනුවත් වී නොතිබුණි. | අරමුණු ඉලක්ක පිහිටුවා ළඟාකර ගැනිම සඳහා කටයුතු කළයුතු වේ. | 2018 වර්ෂයේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ප්‍රකාරව ළගාකර ගත යුතු අරමුණු සඳහා ඇනුවත් වී නොසිටිය වුවත් , ඉදිරියේද අරමුණු 5 අනුව ක්‍රියාත්මක වීමට කටයුතු කරමි. |

3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාථමික මට්ටමේ තනතුරු 3 ක පුරප්පාඩු 05 ක් ද තනතුරු 04 ක අතිරික්ත සේවකයන් 04 දෙනෙකුද ද්වීතිය මට්ටමේ තනතුරු 03 ක පුරප්පාඩු 06 ක් ද පවතින අතර අනියම් සේවකයන් 16 දෙනෙකු ද බඳවා ගෙන තිබුණි. | කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කළයුතු වේ. | අනියම් සේවකයන් ලෙස බඳවා ගෙන ඇති 16 දෙනා අතරට පෙර පාසැල් ගුරු සේවය සහ පොම්පාගාර වල රාජකාරී සඳහා සේවකයින් යොදවා ගෙන ඇත. |

3.3 වත්කම් කළමනාකරණය

3.3.1 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවට අයත් එකතුව රු.1,905,850 ක්වූ වත්කම් 06 ක්හා වටිනාකම හඳුනා නොගත් වත්කම් ඒකකයක් නිශ්කාර්යව පැවතුනි. | අදාල වත්කම් භාවිතයට ගැනීම, භාරදීම හෝ අපහරණය කටයුතු සිදුකළයුතු වේ. | මෙම උපකරණ කට්ටලය උතුරු මැද ප්‍රධාන අමාත්‍යාංශය ලැබී ඇති අතර එම අමාත්‍යංශය සමඟ තැන්පත් කොට වෙන්දේසි ගිණුමට හෝ නැවත එම අමාත්‍යංශය භාර දීමට කටයුතු කරන බව දන්වමී. |

3.3.2 වාර්ෂික භාණ්ඩ/තොග සමීක්ෂණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ ප්‍රකාරව 2018 වර්ෂයේ පුස්තකාලයේ රු.93,922 ක් වූ පොත් 453 ක් අස්ථානගත වි තිබුණි. | වගකිවයුතු පාර්ශවයන්ගෙන් අලාභ අයකර ගැනිමට කටයුතු කළයුතු වේ. | 2018 වසරේ පොත් සමීක්ෂණය අනුව පොත් 36ක් රාක්කවල අතපසු වී තිබීමෙන් හමු වී ඇති අතර ඉතිරි පොත් ජංගම සේවයේදී පොත් අතපසු වී ඇත. එම කාර්ය සඳහා දැනට නිරත වී සිටින අතර 2019 වසරේ සමීක්ෂණයට පෙර එම පොත් සොයා ඉදිරිපත් කරන බව දන්වමී. |

3.4 ප්‍රසම්පාදනය

---------------

ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රසම්පාදන සැළැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළයුතු වේ. | පිලිගනිමි. 2019 වර්ෂයේ දී ප්‍රසම්පාදන සැලැස්ම සකසා ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසියාකාරව සිදු කරගෙන යනු ලබන බව දන්වමි. |

04. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**-----------------------------------------**

**විගණන හා කළමණාකරන කමිටු ක්‍රියාත්මක කිරීම**

**------------------------------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| 2016 ජනවාරි 28 දිනැති අංක DMA/2009(1)(i) දරන මුදල් හා කළමණාකරන හා විගණන චක්‍රලේඛ ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතු වේ. | 2019 වර්ෂයේ විගණන කළමණාකරන කමිටුවන් ස්ථාපිත කර ඒ අනුව 2019 පෙබරවාරි මස 06 වන දින පළමු විගණන කළමනාකරණ කමිටුව පවත්වන ලදි. |